**අනුරාධපුර මහා නගර සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 16 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ)** 2014 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබුණු හා 2013 වර්ෂයේ මිලදී ගත් වත්කම්වල වටිනාකම එකතුව රු.17,887,500 ක් ප්‍රාග්ධන යෙදූමට ආදායමින් දායකවීමේ ගිණුමට බැර කලයුතු වුවත් සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි.

**(ආ)** දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගන්නා ලද යන්ත්‍රෝපකරණවල වටිනාකම් එකතුව රු.31,244,000 ක් ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි

**(ඇ)** 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෝටර් රථ හා කරත්ත උපලේඛනයෙහි දක්වා ඇති ඩබල් කැබ් රථයේ වටිනාකම රු.6,390,000 ක් වුවද, ස්ථාවර වත්කම් ලේඛනයේ එය රු.390,000 ක් ලෙස දක්වා තිබුණි.

**(ඇ)** 2010,2011,2013 හා ඊට පෙර වර්ෂයන්ට අදාල විගණන ගාස්තුව වන රු.3,184,089 ක් 2014 වර්ෂය වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබූ අතර 2014 වර්ෂයේ විගණන ගාස්තුව සඳහා ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ඉ) සේවක ණය උපලේඛන අනුව 2014 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය රු.9,231,170 ක් වුවද ශේෂ පත්‍රයේ දක්වා තිබුණේ රු.9,593,230 ක් වශයෙනි.

**1.3.2 නොසැසඳු ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම් විෂයයන් 5 ක ශේෂයන් හා අදාල උපලේඛනවල දක්වා තිබුණු ශේෂයන් අතර රු.761,369 ක වෙනසක් පැවතුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහා නගර සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.50,146,300 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ඌණතාවය රු.10,061,546 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**2.2.1 උසාවි දඩ**

2014 වර්ෂයට අදාලව අයවිය යුතු උසාවි දඩ ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර උසාවි දඩ ලේඛණය 2014 වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි.

**2.2.2 මුද්දර ගාස්තු**

2013 හා 2014 වර්ෂවලට අදාල මුද්දර ගාස්තු ආදායම හඳුනා ගෙන හෝ ගිණුම්ගත කර නොතිබුණු අතර මුද්දර ගාස්තු ලේඛණය යාවත්කාලීන කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්ක්ෂමතා**

**(අ)** ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව වර්ෂ 2ක් ඉක්මවූ තැන්පතු ආදායමට බැර කල යුතු වුවත් 2010,2011,2012 වර්ෂ වලට අදාලව ආදායමට බැර නොකල ඉකුත් තැන්පතු වල වටිනාකම රු.2,244,156 ක් විය.

**(ආ)** ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6 වගන්තිය හා 1978 අංක 42 දරන පළාත් පාලන ආයතන නිල නිවාස (සන්තනය ආපසු ලබා ගැනීම) පනතේ 03 (I) වගන්තිය ප්‍රකාරව සේවයේ යෙදී සිට විශ්‍රාමගිය හෝ ස්ථාන මාරුවී ගිය නිලධාරීන් වෙත ලබාදුන් නිවාස ආපසු භාර ගැනීමට කටයුතු කළයුතු වුවත් සභාව සතු නිවාස 18 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(ඇ)** මහ නගර සභා ආඥා පනතේ 247 (අ) වගන්තිය හා 254 වගන්තිය ප්‍රකාරව 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනත් කාර්ය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද හෝටල්, ආපන ශාලා හෝ නවාතැන් පොළ වලින් එම ආයතන වල ඉකුත් වර්ෂයේ ලැබීම් වලින් සියයට 1ක් නොඉක්මවන බද්දක් අයකල යුතු වුවද ඒ අනුව කටයුතු නොකරන ලද අවස්ථා නිරීක්ෂණය විය.

**(ඈ)** 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

**04. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය.

(ආ) ගිණුම්කරණය.

(ඇ) ආදායම් පරිපාලනය.

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ගබඩා පාලනය.